**EMBASSY OF THE DEMOCRATIC SOCIALIST**
**REPUBLIC OF SRI LANKA**
スリランカ民主社会主義共和国大使館

# සිංහල හා දෙමළ අළුත් අවුරුදු උත්සවය - ටෝකියෝ

වර්ෂ 2006 අප්‍රේල් මස 16 වෙනි දින පෙරවරු10:00 සිට පස්වරු7:00දක්වා **ටෝකියෝ මිනාතෝ කුභි ෂිබඋරා ෂෝගක්කෝහි** සිංහල හා දෙමළ අළුත් අවුරුදු උත්සවය පැවැත්වේ. ජපානයේ ශ්‍රී ලංකා ශිෂ්‍ය සංගමය, ජපානයේ ශ්‍රී ලංකා සංගමය හා ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විසින් මෙම උත්සවය සංවිධානය කරනු ලැබේ.

රාජකීය මිකාසා කුමරු හා මිකාසා කුමරිය ප්‍රධාන අමුත්තන් වශයෙන් පැමිනෙන අතර ජපන් ශ්‍රී ලංකා මිත්‍රත්ව සංගමයේ සභාපති ගරු යසුඔ ෆුකුදා මැතිතුමා, ජපානයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු සභාවේ සභාපති ගරු හෝසෙයි නොරොතා මැතිතුමා සහ ශ්‍රී ලංකා සාම ක්‍රියාදාමයේ ජපන් රජයේ විශේෂ නියෝජිත ගරු යසුෂි අකාෂි මැතිතුමා ද උත්සවයට සහභාගිවීමට නියමිතය.

ජපානයේ විවිධ ප්‍රදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන් හා ජපන් ජාතික හිතමිතුරන් විශාල සංඛ්‍යාවක් උත්සවයට සහභාගිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

සිංහල හා දෙමළ අළුත් අවුරුදු උත්සවය කොට්ට පොරය, කඹ ඇදීම වැනි සාම්ප්‍රදායික ක්‍රීඩාවන්ගෙන්ද සංස්කෘතික සංදර්ශනයන්ගෙන් සහ දේශීය රසකැවිලි ඇතුලත් අවුරුදු කෑම මේසයකින්ද සමන්විත වන අතර අවුරුදු කුමාරිය තේරීමේ තරඟයක් සහ ළමා විකට ඇඳුම් තරඟයක්ද පැවැත්වේ.

එමෙන්ම "සීහෙන්ස්" සංගීත කණ්ඩායම සුප්‍රසිද්ධ සංගීතඥ ජගත් වික්‍රමසිංහ මහතා සමගින් විශේෂ සංගීත සංදර්ශනයක්ද ඉදිරිපත් කිරීමට සැලසුම් යොදාඇත.

මෙම උත්සවය ශ්‍රී ලංකා රූපවාහිනී සේවයේ විශේෂ කණ්ඩායමක් මගින් පටිගතකර ශ්‍රී ලංකා රූපවාහිනී සේවය ඔස්සේ විකාශනය කෙරේ.

ටෝකියෝහි පැවැත්වෙන මෙම සිංහල හා දෙමළ අළුත් අවුරුදු උත්සවය ජපානයේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට සිය ජපන් මිතුරු මිතුරියන් සමගින් අවුරුදු සැමරීමට ලැබෙන මහඟු අවස්ථාවකි.

ඔබ පවුලේ සාමාජිකයන් සහ හිතමිතුරන්ද කැටුව මෙම උත්සවයට පැමිණ සහභාගි වනමෙන් ඔබසැමට මෙයින් ආරාධනා කෙරේ.

**2-1-54 Takanawa, Minato-ku, Tokyo 108-0074, Japan**
**Tel: (03)3440-6911/6912, Fax : (03)3440-6914, E-mail: tokyojp@lankaembassy.jp**
**URL: www.lankaembassy.jp**
〒107-0074 東京都港区高輪２－１－54